**UNIVERSITY OF PERADENIYA**

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 100 මට්ටම - 2022**
**கலைத்தேர்வுப் பரீட்சை (வெளிவாரி–புதிய பாடத்திட்டம்) 100 வது தேர்ச்சி மட்டம் – 2022**
**Bachelor of Arts (External - New Syllabus) Examination 100 Level - 2022**

ප්‍රායෝගික ව්‍යාකරණය සහ සිංහල භාෂා මුහුණුවර
**SINE 101**

කාලය පැය**(03)** තුනයි.
மூன்று(03) மணித்தியாலங்கள்.
Time three **(03)** Hours.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ.
எழுத்து தெளிவில்லாதவிடத்து புள்ளிகள் குறைக்கப்படும்.
Marks will be deducted for illegible hand writing.

ප්‍රශ්න 05ට පිළිතුරු සපයන්න.
------ வினாக்களுக்கு மட்டும் விடையளிக்க.
Answer ------ questions only.

මෙම ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 08කි.
இந்த வினாப்பத்திரத்தில் ------ வினாக்கள் உள்ளன.
There are ------- questions in the question paper.

---

01. මනුෂ්‍ය භාෂාවේ ස්වභාවය එහි උත්කෘෂ්ටතා ලක්ෂණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

02. 'මානව භාෂාව සංස්කෘතියේ නිර්දේශයකි.' භාෂාව හා සංස්කෘතිය අතර ඇති සබඳතාව ඉහත ප්‍රකාශයත් ඇසුරු කොට ගෙන විමසන්න.

03. සිංහලයේ උපභාෂාමය විවිධත්වය පැහැදිලි කොට එය ක්‍රමානුකූලව හීන වී යන්නේදැ'යි සාකච්ඡා කරන්න.

04. සිංහල භාෂාවේ සාමාජීය විවිධතාව සනිදර්ශනව සාකච්ඡා කරන්න.

05. සිංහලයේ ඉහළ සහ පහළ භාෂා ස්වරූපයේ ව්‍යාකරණාංග එකිනෙකට වෙනස් වන අයුරු භාෂා ද්වීරූපතා සංකල්පය ඇසුරින් පහදන්න.

06. ව්‍යවහාර සිංහලයේ ප්‍රාස්තාවික වාග්ව්‍යවහාර පිළිබඳ විධිමත් අධ්‍යයනයක යෙදෙන්න.

07. ලේඛන සිංහල වාක්කෝෂයේ න-ණ; ල-ළ විභේදනය වචනවල අර්ථ විභේදනයට හේතු වන අයුරු පහදන්න.

08. පහත දැක්වෙන වැකිවල සදොස්තැන් ඇතොත් ඒ කවරේදැ'යි හේතු දක්වමින් නිදොස් කොට, නැවත එම වාක්‍ය ලියා දක්වන්න.

    1. ගැහැණු කෙනෙක් ජනාධිපතිව සිටියාය.
    2. කෙනෙක් මුසා බස් තෙපලයි.
    3. මල්ලී ද තෝ ද එහි යති.
    4. මෙවන් කාන්තාවක ලැබුණොත් මා විවාහ වෙමි.
    5. බහුතරයා එය නොපිළිගනිති.
    6. ගොවියන් ද ගෙවිලියන් ද පෙළපාලි යති.
    7. අපේක්ෂකයින් කීප දෙනෙක් ඡන්දය වර්ජනය කළහ.
    8. පිළිගැනීමේ උළෙලේදී ඇමතිතුමා විසින් ක්‍රිකට් ක්‍රීඩකයන් ඇගයෙති.
    9. නැන්දම්මා ඔහු දරුවෙක් මෙන් ඇතිදැඩි කළාය.
    10. දේශපාලනඥයා විසින් අධිකරණ හා සමාජ නීතිරීති උල්ලංඝනය කෙරෙති.

(සැම පිළිතුරකටම ලකුණු 20 බැගිනි).